මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

11 ශ්‍රේණිය	අ.පො.ස. (සා. පෙළ) පෙරහුරු පරීක්ෂණය- 2025 (2026)	44	S	I, II

නම - .....

නැටුම (දේශීය) I

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න තීරණය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් -

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල , දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01.'සිද්ධ මුනිදු වැඩගිද බෝමුල විදුරාසන....' යන්න..... කවි ගායනයකට අයත් වේ.
(1) නමස්කාර (2) බලි (3) කඩතුරා (4) මෝල් ගස්

02. ආංගික අභිනයේ දී .....ආදිය 'අංග'කොටසට අයත් වේ.
(1) හිස, කද , බෙල්ල, උරබාහු (2) දැත්, දෙපා, වැලමිට, උරබාහු
(3) හිස, කද, දැත්, දෙපා (4) කද , දෙපා, දෙඋර, ඉන

03. සංගීතය, ශබ්ද හා නාද මාධ්‍ය කොට ගන්නා සේම නර්තනය ..... මාධ්‍ය කොට ගනී.
(1) වලනය (2) හැඩතල (3) රිද්මය (4) තාලය

04. **විස්මය** නමැති ස්ථායී භාවය අවදි වීමෙන් ..... රසය උත්පාදනය වේ.
(1) වීර (2) රෞද්‍ර (3) භයානක (4) අද්භූත

05. දළදා කරඬුව මාළිගයෙන් පිටතට වැඩම වීමේ දී ..... හේවිසි වාදනය කරනු ලැබේ.
(1) ගෙවැදුම (2) අඹරා (3) තේවා (4) පෝය

06.'**මළ බෙර** ' වාදනය සඳහා අතීතයේ දී මුලින්ම යොදාගෙන ඇත්තේ ..... බෙරය යි.
(1) දවුල් (2) තම්මැට්ටම (3) ලෝහ (4) පටහ

07. ශාන්තිකර්මයන්හි අන්තර්ගත ගායනා ..... වශයෙන් වෙන්කර දැක්විය හැකිය.
(1) තාලානුකූල හා රිද්මයානුකූල (2) ආඝාතාත්මක හා අනාඝාතාත්මක
(2) ආඝාතානාමක හා රිද්මයානුකූල (4) අනාඝාතාත්මක හා තාලානුකූල

08.'**පානා අසිරි නොහැර .....**' යන්න ..... කවියකි.
(1) පන්තේරු (2) රබන් (3) ප්‍රශස්ති (4) නමස්කාර

09. දේවදාසින් හත් දෙනෙකුට තැන්පත් මුදලකින් මාස්පතා වේතනයක් දුන් බව..... සෙල්ලිපියේ සඳහන් වේ.
(1) සැස්සේරුව (2) කොරවක් ගල (3) ගල් ආසන (4) පාලමොට්ටායි

10. ප්‍රශස්ති කාව්‍ය ගායනයේ දී රජුන් පිළිබඳව වර්ණනා කිරීම සඳහා යොදා ගත් ගායකයෝ .....ලෙස හඳුන්වයි.
(1) වන්දිභට්ටයන් (2) පොතේ ගුරුන් (3) විරිදුකරුවන් (4) කාරියකරවන රාළ

11. අ.පො.ස (උ.පෙළ) සඳහා නර්තනය විෂයක් වශයෙන් ඇතුළත් වූ වර්ෂය වන්නේ,
(1) 1934 යි. (2) 1952 යි. (3) 1972 යි. (4) 1978 යි.

12. සොකරි නාටකයේ දී කුඩා දරුවකු මෙන් වෙස් ගන්වා ඇති වෙදරාළගේ පුතා වන්නේ,
(1) සොන්තානා ය. (2) පරයා ය. (3) හෙංවා ය. (4) ආඩිගුරු ය.

13. සිංහල ලී කෙළි නැටුමේ එන **ලී දඟය ගෙතීම** හා සමාන වූ දෙමළ ගැමි නැටුම වන්නේ,
(1) කෝලාට්ටම් ය. (2) පින්නල් කෝලාට්ටම් ය. (3) අරිච් වෙට්ටු ය. (4) සුලකු ය.

14. කරදිය මුද්‍රා නාට්‍ය යේ රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණය සිදු කරන ලද්දේ,
(1) සෝමබන්දු විද්‍යාපති මහතා ය. (2) චිත්‍රසේන ඩයස් මහතා ය.
(3) සේන වලවේ මහතා ය. (4) මඟින්ද ඩයස් මහතා ය.

15. රබන් කවියක පද කොටස කි.
(1) පුටුව සරසලයි මම සැල කරන්නේ.... (3) තුන්මස් තුන් පෝයක් ගතවන්නේ....
(3) රටකට මව් සමගින්.... (4) කොකුම් පාට කිතුලින්ඔත් වළදා...

16. දවුලේ හැඩයට සමාන භාරතීය නර්තන සම්ප්‍රදායකට වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය කි.
(1) මද්දලය. (2) වෙන්ඩාව. (3) මෘදංගය. (4) දවුල.

17.'විජයතුමා තම්මැන්නේ....' යන ගීතයේ පද රචනය කර ඇත්තේ,
(1) සුදත් සමරසිංහ මහතා ය. (2) විදාගම මෛත්‍රී හිමි ය.
(3) ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා ය. (4) ටිබෙට් ජාතික එස්.මඟින්ද හිමි ය.

18. අංගරචනයේ දී බාහිර ස්වරූපය වෙනස් කර, **චරිතයට අවශ්‍ය පරිදි** සකස් කර ගැනීම,
(1) ස්වභාවික අංගරචනය යි. (2) ශෛලිගත අංගරචනය යි. (3) විකාරරූපී අංගරචනය යි. (4) චරිතාංග අංගරචනය යි.

19. නර්තනයේ මූලික ඉරියව්ව **'අරමණ්ඩිය'** ලෙස සලකනු ලබන නර්තන සම්ප්‍රදාය වන්නේ,
(1) පහතරට ය. (2) සබරගමු ය. (3) භරත ය. (4) කතකලි ය.

20. පිළිවෙලින් **සබරගමු , පහතරට, උඩරට** නර්තන කලාවන්හි ප්‍රවීන නර්තන ශිල්පීන් වන්නේ,
(1) රද්දැල්ලේ පොඩි මහත්තයා, ජේ.ඊ. සේදරමන්, කේ.එස්. ප්‍රනාන්දු යන මහත්වරුන් ය.
(2) අර්නෝලිස් ඉඹුල්ගොඩ, විල්සන් ඔලබොඩුව, එස්. පණිභාරත යන මහත්වරුන් ය.
(3) ඩී.වී. හීන්නිලමේ, කේ.එස්.ප්‍රනාන්දු, එස්.පණිභාරත යන මහත්වරුන් ය.
(4) කේ.එස්. ප්‍රනාන්දු, ඩී.වී. හීන්නිලමේ, අර්නෝලිස් ඉඹුල්ගොඩ යන මහත්වරුන් ය.

21.



ඉහත ඡායාරූපයෙන් පිළිබිඹු වන භාවය හා රසය වන්නේ,
(1) විස්ම හා අද්භූත ය. (2) උත්සාහ හා වීර ය. (3) විස්ම හා වීර ය. (4) උත්සාහ හා බිහත්ස ය.

22. මණිපුරි නර්තන යේ රාධා හා කෘෂ්ණන්ගේ ප්‍රේම වෘතාන්තය තේමා කර ගනිමින් නිර්මාණය වී ඇති නර්තන අංගයකි.
(1) රාස්ලීලා. (2) තෝඩායම. (3) පුංග් චෝලම්. (4) මෙලප්පදම්.

23. ප්‍රස්තාරකරණයේ දී + හා / යන සලකුණු වලින් සංකේතවත් කරනු ලබන්නේ,
(1) තෙයි හා තිත් ය. (2) තිත් හා තෙයි ය.
(3) අවග්‍රහ හා තෙයි ය. (4) අවග්‍රහ හා තිත් ය.

24. **'සමන් දේවාල පුද සිරිත්'** යන කෘතිය රචනා කරන ලද්දේ මහාචාර්ය,
(1) ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය යි. (2) තිස්ස කාරියවසම් මහතා යි.
(3) මුදියන්සේ දිසානායක මහතා යි. (4) ජයසේන කෝට්ටගොඩ මහතා යි.

25. වේදිකාවට උචිත ලෙස පහතරට '' නාග කන්‍යා , ගිනි සිසිල , පන්දම් පාලිය''වැනි නර්තනාංගයන්හි රංග වින්‍යාසය සකස් කරන ලද ශිල්පියා වන්නේ,
(1) කේ.එස්. ප්‍රනාන්දු ය. (2) ඩී. වී.හිත්නිලමේ ය. (3) එම්.එච්. ගෝමිස් ය. (4) සවරිස් සිල්වා ය.

■ **අංක 26 සිට 29 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු වඟව ඇසුරෙන් සපයන්න.**

	A	B	C
1	සිංහරාජ	දොං පිංත ගතදොංත	123 +123
2	සැවලා	දොදොංත තකු දොං	12 +123
3	වෛරොඩි	දොං දොංපිං පිං ගපිගත	1234 +1234
4	තුරගා	පිංගත ගොගොා	12 +1234

26. A තීරුවේ 1 පේළියේ ඇති වන්නමට සමාන බෙර පදය හා තාල රූපය දැක්වෙන වරණය තෝරන්න.
(1) B තීරුවේ 1 පේළිය හා C තීරුවේ 2 පේළිය
(2) B තීරුවේ 2 පේළිය හා C තීරුවේ 3 පේළිය
(3) B තීරුවේ 3 පේළිය හා C තීරුවේ 4 පේළිය
(4) B තීරුවේ 4 පේළිය හා C තීරුවේ 1 පේළිය

27. C තීරුවේ 2 පේළියේ ඇති තාල රූපයට සමාන වන්නම හා බෙර පදය දැක්වෙන වරණය කුමක්ද?
(1) A තීරුවේ 4 පේළිය හා B තීරුවේ 1 පේළිය
(2) A තීරුවේ 3 පේළිය හා B තීරුවේ 2 පේළිය
(3) A තීරුවේ 2 පේළිය හා B තීරුවේ 3 පේළිය
(4) A තීරුවේ 1 පේළිය හා B තීරුවේ 4 පේළිය

28. B තීරුවේ 3 පේළියේ ඇති බෙර පදයට අදාළ වන්නම හා තාල රූපය දැක්වෙන වරණය දක්වන්න.
(1) A තීරුවේ 1 පේළිය හා C තීරුවේ 2 පේළිය
(2) A තීරුවේ 3 පේළිය හා C තීරුවේ 1 පේළිය
(3) A තීරුවේ 2 පේළිය හා C තීරුවේ 4 පේළිය
(4) A තීරුවේ 4 පේළිය හා C තීරුවේ 3 පේළිය

29. 'සුරිදුන් පෙර සිටන් ... ' යන කවි පදයට අදාළ වන්නම බෙර පදය සහ තාල රූපය ඇතුළත් වරණය තෝරන්න.
(1) A තීරුවේ 1 පේළිය , B තීරුවේ 4 පේළිය හා C තීරුවේ 3 පේළිය
(2) A තීරුවේ 3 පේළිය , B තීරුවේ 2 පේළිය හා C තීරුවේ 1 පේළිය
(3) A තීරුවේ 4 පේළිය , B තීරුවේ 1 පේළිය හා C තීරුවේ 2 පේළිය
(4) A තීරුවේ 2 පේළිය , B තීරුවේ 3 පේළිය හා C තීරුවේ 4 පේළිය

30 'ආංගිකම භුවනම යස්‍ය වාචිකම...'යනුවෙන් ආරම්භයේදී ම ශිව දෙවියන්ට නමස්කාරයක් දක්වා ඇති ග්‍රන්ථය වන්නේ,

(1) භගවත් ගීතාව යි.
(2) මහා භාරතය යි.
(3) රාමායනය යි.
(4) අභිනය දර්පනය යි.

31. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දී ශිල්පීය දක්ෂතා පෙන්වීම සඳහා වාදනය කරනු ලබන්නේ,

(1) මඟුල් බෙර ය. (2) පිං බෙර ය. (3) වැදුම් අත් ය. (4) අතබා බෙර ය.

32.'දොංතකු දොංතකු දොං පිං ගත් තත් පිං තරිකිට ' යන බෙර පදය ප්‍රස්තාරගත කළ හැකි තාල රූපය තෝරන්න.

(1) 2 + 2+ 3 තුන්තිතට ය.
(2) 2 + 2+ 4 තුන්තිතට ය.
(3) 2 + 3+ 3 තුන්තිතට ය.
(4) 3 + 3+ 4 තුන්තිතට ය.

33. ගොඩ සරඹ නර්තනයේ දී ' තක්කඩ කඩතක පිපිකුද - පික්කඩ කඩතක පිපිකුද... යන කෂ්තිරම නර්තනය කරනු ලබන්නේ,

(1) අර්ධ චක්‍ර සරඹයට ය. (2) බඹර සරඹයට ය. (3) පැනීම් සරඹයට ය. (4) චන්ද්‍රිකා සරඹයට ය.

34. උඩරට නර්තන කලාවට සිදුකරන ලද මෙහෙවර වෙනුවෙන් 1950 වසරේ දී නිකුත්කරන ලද තැපැල් මුද්දරයේ ඇතුළත් ජායාරූව,

(1) නිත්තවෙල ගුණයා මහතාගේ ය.
(2) ජේ.ඊ. සේදරමන් මහතාගේ ය.
(3) එස්. පණිභාරත මහතාගේ ය.
(4) චිත්‍රසේන ඩයස් මහතාගේ ය.

35. දහඅට වන්නම් අතරින් තාලරූප දෙකකට ගායනා කරනු ලබන එකම වන්නම වනුයේ,

(1) මයුරා ය. (2) මුසලඩි ය. (3) තුරගා ය. (4) සැවිලා ය.

36.'දෝං පිං පිං තකට දොංතක' යන බෙර පදය වාදනය කළ හැක්කේ මාත්‍රා,

(1) 2+ 3 දෙතිතට ය. (2) 3 + 4 දෙතිතට ය. (3) 2 + 4 දෙතිතට ය. (4) 2 + 2+ 4 තුන්තිතට ය.

37. කොහොඹා කංකාරියේ එන **ගායනා සහිත** නර්තනාංග වන්නේ,

(1) අස්නෙ , ආවැන්දුම ය.
(2) කොහොඹා හැල්ල, අස්නේ ය.
(3) ආවැන්දුම , යක්ඇනුම ය.
(4) මඩුපුරය, හත්පදය ය.

38.**'දොං පිංත ගත දොංත'** වටටමට නර්තනය කළ හැකි අඩවිවක් වනුයේ,

(1) තාම දොම්නිගත දොම්කිට කඩතක තරිකිට..... ය.
(2) තත් තොග තකතොග තක්කඩ තරිකිට තක තොග..... ය.
(3) ජෙන් තත් තත් ජෙන් තත් තත් ජෙන් තත් තත් ජෙන් තා..... ය.
(4) තාත් පිං තත්තත් පිං තත් පිං තත් තත්..... ය.

39. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී දේවත්වයෙන් පුද ලබන යකුන් වන්නේ,

(1) කඩවර යකා,කලු යකා , පිරි යකා ය.
(2) වැදියකුන් , මෙලෙයි යකුන් , රුජ්පා යකුන් ය.
(3) වලියකුන් , කලු යකා , වැදි යකුන් ය. .
(4) මෙලෙයි යකුන් , පිරි යකා , අභිමාන යකා ය.

40. නර්තන විෂයයේ විද්වතුන් අතරින් මහාචාර්ය පදවියක් ලබා ගත් ප්‍රථම ලාංකිකයා වන්නේ,

(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා ය.
(2) මහාචාර්ය නිස්ස කාරියවසම් මහතා ය.
(3) ආචාර්ය චිත්‍රසේන ඩයස් මහතා ය.
(4) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා ය.

**

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

11 ශ්‍රේණිය	අ.පොෂ. (සා. පෙළ) පෙරහුරු පරීක්ෂණය- 2025 (2026)	44	S	II

නම - .....

නැටුම් (දේශීය) II

උපදෙස් -

- පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමිවේ.

1. සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(1) සකපෝරුව භාවිත වන්නේ..... කර්මාන්තය සඳහාය.
(2) උඩරට නර්තන සම්ප්‍රදායේ දුනුමාලප්පුව ගායන ..... නර්තනාංගයකි.
(3) "විදෙන ලෙලෙන නරුබර පුළුලුකුල රැදි ... "යන කවිය අයත් කාව්‍ය ග්‍රන්ථය ..... නම් වේ.
(4) කතක් නර්තන සඳහා යොදාගත් පැරණිම තත් වාද්‍ය භාණ්ඩය..... නමින් හැඳින්වේ.
(5) "ගනි ගත ගුම රිම් ගත ගති ගත ගතිත ගතම්" යන බෙරපදයෙන් .....කෝලම් සහාවට පිවිසේ.
(6) රබින්ද්‍රනාත් තාගෝර් තුමාගේ ප්‍රධානත්වයෙන් හොරණ ශ්‍රීපාලි ආයතනයට ..... වර්ෂයේ දී මුල්ගල තබන ලදී.
(7) රොබට් නොක්ස් විසින් ..... නම් කෘතිය රචනා කරන ලදී.
(8) ඩබ්ලිව්.බී. මකුලොළුව මහතා විසින් ..... ගීත නාටකය නිර්මාණය කරන ලදී.
(9) ග්‍රහ පන්ති කවි ගායනාවල හිරු , සද , කුජ , බුද , ගුරු,සිකුරු .....රාහු ..... යන නවග්‍රහයන් පිළිබඳව සඳහන් වේ.
(10) කරදිය මුද්‍රානාට්‍යයේ රංග රචනය සහ පසුතල නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?
1. ..... 11. .....

2. (1) සිංහරාජ වන්නමේ බෙර පදය අදාල තිතට ප්‍රස්ථාර කරන්න.
(11) "රනේ රුවසෙ වත රුවින් දිලේ දෝ".....
ඉහත දැක්වෙන කවි පදය මැදුම තනි තිතට ප්‍රස්ථාර කරන්න.
(111) සැවුලා වන්නමේ කස්තිරම ප්‍රස්ථාර ගත කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.
1. තුන් තිතේ ප්‍රභේද
2. ගැමි නැටුම්
3. දේශීය මුද්‍රා නාට්‍ය
4. මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ මහතා
5. ග්‍රහ පන්ති කවි

4. ශාන්ති කර්ම වූ කලි දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කරන සාධකයකි.
   (I) දෙවොල් මඩුව ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් හා චාරිත්‍ර විධි දෙකක් නම් කරන්න.
   (II) දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ නර්තනාංග වල සමාන අසමානතා වගුගත කරන්න.
   (III) කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ රංග භාණ්ඩ දෙකක් නම්කර, ඒවා සැකසීමට ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර කරන්න.

5. (I) සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු හතරක් ලියා දක්වන්න.
   (II) කෝලම් නාටකයේ චරිත හතර බැගින් ගෙන මානුෂ හා අතිමානුෂ ලෙස වර්ගීකරණය කරන්න.
   (III) පරයාගේ චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.

6. පහත දැක්වෙන රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

   (I) A හා B රූපයේ නර්තන සම්ප්‍රදායන් නම් කර එක් නර්තන සම්ප්‍රදායක් හඳුන්වන්න.
   (II) C හා D රූපයේ නර්තන සම්ප්‍රදායන් වල නර්තනාංග දෙකක් නම්කර විස්තර කරන්න.
   (III) E රූපයේ දේශාටන වාර්තාකරු නම් කර ඔහුගේ වාර්තාව ඉදිරිපත් කරන්න.

7. (I) සන්නිවේදනය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ වාදනය කළ අවස්ථා හතරක් නම් කරන්න.
   (II) නර්තනයේ යෙදීමෙන් ශරීර සුවතාව පවත්වා ගන්නේ කෙසේදැයි විස්තර කරන්න.
   (III) 'ජාත්‍යන්තර කරළියට යන අපේ නර්තන කලාව' යන තේමාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

***

පිළිතුරු ‘

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තුන්වන වාරය 2025

11 ශ්‍රේණිය නැටුම (දේශීය) I

ප්‍රශ්න අංකය		ප්‍රශ්න අංකය		ප්‍රශ්න අංකය		ප්‍රශ්න අංකය	
1	3	11	4	21	2	31	4
2	3	12	1	22	1	32	1
3	1	13	2	23	3	33	3
4	4	14	1	24	1	34	3
5	2	15	3	25	3	35	2
6	4	16	2	26	2	36	2
7	2	17	4	27	1	37	2
8	3	18	4	28	3	38	4
9	4	19	3	29	4	39	2
10	1	20	3	30	4	40	1

එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 40 ට - මුළු ලකුණු 40 යි.

නැටුම II කොටස

1. (1) මැටි කර්මාන්තය
   (2) රහිත
   (3) සැළලිහිණි
   (4) මුදලි
   (5) සාරංගිය
   (6) 1934
   (7) එදා හෙළ දිව
   (8) දෙපානෝ
   (9) I. සෙනසුරු
   (10) I. චිත්‍රසේන ඩයස්
   11. කේතු
   11. සෝමබන්ධු විද්‍යාපති

1 සිට 8 දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 08 යි.
9 සිට 10 දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - ලකුණු 04 යි.
මුළු ලකුණු - 8 + 4 = 12 යි.

2. (1) සිංහරාජ බෙර පදය අදාළ තිතට ප්‍රස්තාර කරන්න.

/				/				/				/			
1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
දො	දොං	-	ත	ත	කු	දොං	-	දො	දොං	-	ත	ත	කු	දොං	-

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
බෙර පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
මුළු ලකුණු 04 යි.

(11) රනේ රුවසෙ වත රුවින් දිලේදෝ...කවි පද කොටස 3+3 තනි තිතට ප්‍රස්තාර කරන්න.

/			/			/			/		
1	2	3	1	2	3	1	2	3	1	2	3
ර	නේ	-	රු	ව	සෙ	ව	ත	-	-	-	-
රු	වින්	-	දි	ලේ	-	දෝ	-	-	-	-	-

විභාග කර දැක්වීම හා සංකේත සඳහා -ලකුණු 02 යි.
කවි පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02 යි.

මුළු ලකුණු 04 යි.

(III) සැවුලා වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න.

∧		/				∧		/			
1	2	1	2	3	4	1	2	1	2	3	4
කු	ද	ග	ජි	ග	ත	කු	ද	ග	ජි	ග	ත
කු	ද	ග	ජි	ග	ත	කු	ද	තා	-	-	- //
කු	ද	ග	ජි	ග	ත	කු	ද	තා	-	-	- //
කු	ද	තා	-	-	-	කු	ද	තා	-	-	-
කු	ද	ග	ජි	ග	ත	කු	ද	ග	ජි	ග	ත
කු	ද	ග	ජි	ග	ත	කු	ද	ත			

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02 යි.
කස්තිරම ප්‍රස්තාර කිරීමට - ලකුණු 02 යි.
මුලු ලකුණු 04 යි.

2. **පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනකට කෙටි සටහන් ලියන්න.**

(1) තුන්කිතේ ප්‍රෙන්ද

- තනි තිතේ මුලික තිත් රූප නම් කිරීම
- තිත් රූප තුනක් එකතු වීමෙන් ගොඩ නැගෙන බව
- 2+ 2+ 3 තුන් තින හා 2 +2 + 4 තුන්තින නම් කර ,
- සංඥා භාවිතය , උදාහරණ දැක්වීමට

ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේ නම් - ලකුණු 04 යි.

(2)ගැමි නැටුම්

- සිංහල හා දෙමළ නැටුම් නම් කිරීම.
- ගැමි ජනතාවගේ ජීවන රෑන්තින්, ඇදහිලි විශ්වාස,
- ආගමික පසුබිම,ඇදුම් පැළඳුම්,රංග විත්‍යාසය, විනෝදාස්වාදය,උපකරණ භාවිතය
- ඉහත කරුණු හදුනා ගනිමින් සමාන අසමානතා දක්වමින් නර්තනාංග දෙකක් උදාහරණයට ගනිමින් කරුණු දැක්වීම

ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේ නම් - ලකුණු 04 යි.

(3) දේශීය මුද්‍රා නාට්‍ය

- මුද්‍රා නාට්‍ය හැදින්වීම
- තාගෝර් තුමාගේ පැමිණීම ආරම්භයට හේතු වූබව
- හොරණ ශ්‍රී පාලිය සමග සිදුකළ නිර්මා ණ
- ඉන්දියාවට ගොස් ඉන්දියානු නර්තන ඉගෙනගත් ශිලපීන් පිළිබඳව හා ඔවුන්ගේ නිර්මාණ
- දේශීය මුද්‍රා නාට්‍ය නම් කිරීම

ඉහත කරුණු ඇසුරෙන් ලියා තිබේ නම් - ලකුණු 04 යි.

(4) මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ

- පහතරට නර්තන සම්ප්‍රදායට විශාල මෙහෙයක් කළබව
- පහතරට නර්තන සම්ප්‍රදාය පිළිබඳව විශ්ව විද්‍යාල උපාධික් ගත් බව
- සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ ප්‍රථම උපකුලපති බව
- එතුමා රචනා කළ ග්‍රන්ථ පිළිබඳ තොරතුරු

ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේ නම් - ලකුණු 04

(5) ග්‍රහ පන්ති කවි

- බලි ශාන්තිකර්මයේ අන්තර්ගත බව
- නවග්‍රයන්ගෙන් ඇතිවන්නා වූ අපල උපද්දව දුරු කර ගැනීමට පවත්වන බව
- ග්‍රහයන් නම් කිරීම
- දිශා , විමාන (රෑක්ෂ) , ආයුධ , භෝජන , වාහන , දින ඔවුන්ට ඇති බව
- කවි උදාහරණ ලෙස දක්වා තිබීම

ඉහත කරුණුවලින් හතරක් වත් ලියා තිබේ නම් - ලකුණු 04

මෙයින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියා ඇත්නම් මුලු ලකුණු (4 බැගින් 3)= 12

4.

(1) දෙවොල් මඩුවේ පුද ලබන දෙවිවරු - පත්තිනි දේවතාවිය, දෙවොල් , දැඩිමුණ්ඩ, දොළඟ දෙවි,වාහල

දෙවොල් මඩුවේ වාරිත්‍ර - තොටමෙට යාම/මිල්ල කැපීම/බිසෝ නප සිටුවීම/පූනාව් පේ කිරීම/ පහන් පත්තු කිරීම/කාල පත්දම/තොරන් යාගය/මල්යහන් පූජාව/දේවාභරණ පූජාව/දේවාභරණ වැඩමවීම

දෙවිවරු දෙකක් නම් කිරීමට - ලකුණු 02 යි.
වාරිත්‍ර දෙකක් නම් කිරීමට - ලකුණු 02 යි.
මුලු ලකුණු 4 යි.

(11) දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ නර්තනාංගවල සමාන අසමානතා වගුගත කරන්න.

සමානතා	අසමානතා
• යහන් දැක්ම • දෙවොල් • හත්පද පෙළපාලි • තෙල්මෙ	**දෙවොල් මඩුව -** • වාහල • පත්තිනි • තොරණ යාගය **පහන් මඩුව -** • දේව කෝල් පාඩුව • මුදුන් තාලය • කොළොන්න පද • මුගුරු පද • පන්දම් පද • මල්පද නැටීම හා මල්මඩු පුරය

සමානතා දෙකක් නම් කිරීමට - ලකුණු 02 යි.
අසමානතා දෙකක් නම් කිරීමට - ලකුණු 02 යි.
මුලු ලකුණු 04 යි.

(111) රංග භාණ්ඩ -

- ඌරා යක්කම නැටීමේ දී - කෙසෙල් බඩයෙන් සකසන ඌරු රුව ,
- දුනුමාලප්පුව නැටීමේ දී - ලියෙන් සාදන ලද දුන්න හා ඊතලය.
- මධුපුරය නටන අවස්ථාවේ දී - පොල් මල
- වැදි යක්කම -දුන්න
- වනේ යක්කම - වංගෙඩිය හා නවකොළ අත්ත
- ස්වභාවික අමු ද්‍රව්‍ය භාවිතා කරන බව

රංග භාණ්ඩ දෙකක් නම් කිරීමට - ලකුණු 02 යි.
අමු ද්‍රව්‍ය පිළිබඳ විස්තරයට - ලකුණු 02 යි.
මුලු ලකුණු - 04 යි.

5.

(1) සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු හතරක් ලියා දක්වන්න.

- සශ්‍රීකත්වය වර්ධනය කිරීම සහ සමෘධිය පැතීම
- පූජාර්තයෙන්
- විනෝදාස්වාදය
- වසංගත රෝග හා ස්වභාවික විපත් ආදියෙන් ආරක්ෂාවීමට
- අධ්‍යාපනික අවශ්‍යතා

කරුණු හතරක් විස්තර කර දැක්වීමට - ලකුණු 04 යි.

(11) කෝලම් නාටකයේ චරිත හතර බැගින් ගෙන මානුෂ හා අධිමානුෂ ලෙස වර්ග කරණය කරන්න.

මානුෂ	අධිමානුෂ
ජයා	නාගරාක්ෂ
ලෙංචිනා	ගුරුළු රාක්ෂ
මුදලි	මරු රාක්ෂ
නොංචි	නාග කන්‍යා
හේවා	ගරුඩ රාක්ෂ
පොලිස්	පුර්ණක රාක්ෂ
අණබෙර	නරසිංහ අවතාර
මරක්කල	
හෙංචා	
ලියනාරච්චි	

මානුෂ චරිත හතරක් නම් කිරීමට ලකුණු - 02 යි.
අධිමානුෂ චරිත හතරක් නම් කිරීමට ලකුණු - 02 යි.
මුලු ලකුණු - 04 යි.

(111) පරයාගේ චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.

- පරයාගේ රංග වස්ත්‍ර
- සොකරිගේ හා ආඩිගුරුගේ අතවැසියා බව
- චරිත ලක්ෂණ (මුබරි බව/ විකට බව/ප්‍රේක්ෂකයාට හාස්‍ය රසය ලබාදෙන බව.....)
- පරයාගේ නැටුම් අපිළිවෙල බව
- භාෂා උච්චාරණය (උදාහරණ ලෙස දෙබස් දැක්වීම)
- කවි උදාහරණ ලෙස දැක්වීම

ඉහත කරුණු හතරක්වත් විස්තර කර දැක්වීමට - ලකුණු 04 යි.

6. පහත දැක්වෙන රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කතක් ර්නතනය	කතකලි	භරත	මණිපුරි	ස්පිල් බර්ජන්
A	B	C	D	E

(1) A හා B රූපයේ නර්තන සම්ප්‍රදායන් නම් කර එක් නර්තන සම්ප්‍රදායක් හඳුන්වන්න.

- නම් කිරීම - A - කතක් නර්තන සම්ප්‍රදාය / B - කතකලි නර්තන සම්ප්‍රදාය
- තෝරා ගත් නර්තන සම්ප්‍රදාය හඳුන්වන්න - ප්‍රචලිත ප්‍ර දේශ / සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ / නර්තන අංග / රංග වස්ත්‍රාභරණ / වේෂ නිරූපණය /ආරම්භය හා විකාශණය ඇසුරෙන් කරුණු දක්වා තිබේ නම්

නර්තන සම්ප්‍රදාය දෙක නම් කිරීමට ලකුණු - 02 යි.
ඉහත කරුණු ඇසුරෙන් හඳුන්වා ඇත්නම් ලකුණු - 02 යි.
මුලු ලකුණු - 04 යි.

(11) C හා D රූපයේ නර්තන සම්ප්‍රදායේ නර්තනාංග දෙකක් නම්කර විස්තර කරන්න.

- නර්තන සම්ප්‍රදාය නම් කිරීම C - භරත නාට්‍යම් / D - මණිපුරි නර්තන සම්ප්‍රදාය
- C - භරත නාට්‍යම් නර්තනාංග - අලාරිප්පු /ජෙතිස්වරම් /ශබ්දම් / වර්ණම් / පදම් / තිල්ලානා / ශ්ලෝකම් (එක් නර්තනාංගයක් පමණක්)
- D - මණිපුරි නර්තනාංග - රාස්ලීලා / පරේංග් / පුංග්චෝලම් /රිකතාල් චෝලම් / සංකීර්තන් (එක් නර්තනාංගයක් පමණක්)

නර්තන සම්ප්‍රදාය දෙක නම් කිරීමට ලකුණු - 02 යි.
එක් සම්ප්‍රදායකට එක් නර්තනාංගය බැගින් තෝරාගෙන විස්තර කර ඇත්නම් ලකුණු - 02 යි.
මුලු ලකුණු - 04 යි.

(111) E රූපයේ දේශාටන වාර්තා කරු නම් කර ඔහුගේ වාර්තාව ඉදිරිපත් කරන්න.

- නම - ලන්දේසි ජාතික ස්පිල් බර් ජන්
- වාර්තාව - ''මහතුවර පෙරහැරේ රුමත් නරුණියෝ ලස්සනට නටන්.ඔවුන්ගේ උඩුකය